## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2023 (විවෘත පදනම)

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා පවතින පුරප්පාඩුව සඳහා සුදුස්සෙකු තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "නීති කොමිෂන් සභා දෙපාර්මේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලි ව සටහන් කළ යුතු ය. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2024/01/15 දින වේ.**

*සටහන* - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නො ලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

අංක අමප/16/0927/755/008 දරන 2016.06.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මකවන දිනය අමාත්‍ය මණ්ඩලයේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවූ නිලධාරියෙකු නම් තනතුරට පත් වී වසරක් ගත වීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතුය.

(iv) අමාත්‍ය මණ්ඩල තීරණවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04.02 *වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් වසර 15 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

04.03 *පළපුරුද්ද :*

අදළ නොවේ.

05. *වයස් සීමාව :*
අවම වයස අවු. 35 උපරිම වයස අවු. 50 (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් වයස් සීමාව අදාළ නොවේ.)

06. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය,
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය,
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරය-කින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

අංක අමප/16/0927/755/008 දරන 2016.06.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :

03. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615-10x1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 76,175 ක් වන අතර වැටුප් පියවර 20 වේ.

04. *සුදුසුකම් :*

04.01 *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් පිරිනමනු ලැබූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

| ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 45 | අදාළ නොවේ |
| දේශීය විදේශීය පුහුණුවීම් | 20 | |
| අයදුම්කරු විසින් ප්‍රකාශනයට පමුණුවා ඇති නීති පර්යේෂණ පිළිබඳ ප්‍රකාශන | 20 | |
| අතිරේක පළපුරුද්ද | 10 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු ලේකම් තනතුරට පත් කරනු ලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :
යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා අයදුම්කරුවන් විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපතක් ද බැගින් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ:

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. (i) අයදුම්පත්‍රය මේ සමග දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අංක 1-11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 12 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලි ව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම්පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

*සැලකිය යුතු ය.-* අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතු ය.

ආ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි හෝ ඒවායේ මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නො ලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ග යෙන් අයදුම්පත්‍ර එවිය යුතුය.

12. අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන නියෝග, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වන අතර මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් ව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පර තාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

වසන්තා පෙරේරා,
ලේකම්.
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශය.

අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.
2023 දෙසැම්බර් මස 04 වැනි දින.